**ශීර්ෂය 126 - අධ්‍යාපන අමාත්‍යාංශය -2020**

-----------------------------------------------------

**මූල්‍ය ප්‍රකාශන**

**----------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**-------------------------------**

අධ්‍යාපන අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අධ්‍යාපන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූනි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 අගෝස්තු 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට අධ්‍යාපන අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

----------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී. ලං. වි. ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තව දුරටත් විස්තර කර ඇත.මාගේ මතය සඳහා පදනමක් සැපැයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර, ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බවට.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණු බවට.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

### 1.6.1 මූල්‍ය නොවන වත්කම්

---

මූල්‍ය ප්‍රකාශනවලට අදාල මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශය විසින් 2020 වර්ෂයේදී මූල්‍ය නොවන වත්කම් මිලදී ගැනීම් වටිනාකම මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය හා වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශය අතර, රු.23,306,870,589 ක වෙනසක් පැවතුණි. | පාසල්වල අයිතිකාරත්වය අධ්‍යාපන අමාත්‍යාංශය සතු බැවින් දැනට මූල්‍ය නොවන වත්කම් මාරු කර නොමැති බව. | මිලදී ගැනීම්වල අගයන් ACA 6 අනුව හා ACA 2 (i) අනුව සමාන විය යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| **(ආ)** | මූල්‍ය නොවන වත්කම් අයිතමයන් 8 ක ඉකුත් වර්ෂයේ අවසාන ශේෂ සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂ ගිණුම්ගත කිරීමේදී රු.6,713,956,365 ක වෙනසක් නිරීක්ෂණය විය. | 2020 වර්ෂය තුල ආගනනය කල වත්කම්, 2020.01.01 දින ශේෂයට එකතු කර ඇති බව. | වර්ෂය තුල වත්කම් ආගනන වටිනාකම් විගණනය සඳහා ඉදිරිපත් කල යුතුවීම හා ආරම්භක හා අවසාන ශේෂ සැසඳී තිබිය යුතු වීම |

**1.6.2 ආදායම් නොවන ලැබීම්**

-------------------------

මූල්‍ය ප්‍රකාශනවලට අදාල ආදායම් නොවන ලැබීම් ගිණුම්ගත කිරීමේදී පහත සදහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මුදල් රෙගුලාසි 571 පටහැනිව වර්ෂ 2 ක් ඉක්ම වූ රාජ්‍ය ආදායමට බැර නොකල තැන්පතු ගිණුම් 6 ක වටිනාකම රු. 392,352,040 ක් වූ අතර, වර්ෂ 5 ක් ඉක්මවූ රු.15,362,919ක් ද එහි ඇතුලත් වී තිබුණි. | ශේෂයන් නිරවුල් කිරීමට පළාත් දෙපාර්තමේන්තු හා විද්‍යාපීඨ වෙත දැනුම් දී ඇති බව | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව වර්ෂ දෙකක් ඉකුත් වූ තැන්පත් ශේෂ පිළිබඳව කටයුතු කල යුතු වීම. |

**1.6.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් බී ගිණුම**

----------------------------------------------

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව හා පාලන ගිණුමේ අවසාන ශේෂය වර්ෂ ගණනාවක සිට නොසැසඳී පැවතුණු අතර, සමාලෝචිත වර්ෂය අවසානයට එය රු. 26,487,385 කින් නොසැසඳුණි. එම ශේෂය හඳුනාගෙන නිවැරදි කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 1977 වැටුප් ලේඛන සහ වෙනත් ලේඛන විනාශවීම සහ උතුරු නැගෙනහිර 1990 ගිණුම් සැසඳුම් ප්‍රකාශ ඉදිරිපත් නොවීම මෙම වෙනසට හේතු වන බව. | නොසැසඳීම් හඳුනා ගෙන නිවැරදි කිරීමට පියවර ගත යුතුවීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2. 1 අග්‍රිම කළමනාකරණය

----------------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශයේ සමාලෝචිත වර්ෂය සඳහා අනුමත අග්‍රිම සීමාව රු.103,695,711,000 ක් වූ අතර ලැබී තිබුණු මුළු අග්‍රිම වටිනාකම රු.71,256,548,034 ක් වූයෙන් අනුමත සීමාවෙන් රු. 33,216,716,161 ක් හෙවත් සියයට 33 ක් ලැබී නොතිබුණි. | එකඟ වන බව | අනුමත අග්‍රිම සීමාවන් තුල අග්‍රිම ලබාගැනීම සඳහා මහා භාණ්ඩාගාරය සමග කටයුතු කළයුතුවීම. |

### 2.2 වියදම් කළමනාකරණය

----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැය විෂයයන් 6 ක රු.528,175,050 ක් ප්‍රාග්ධන ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණු අතර, වැය විෂයයන් 07 ක රු.223,170,000 ක ප්‍රාග්ධන ප්‍රතිපාදන වලින් සියයට 52 සිට සියයට 86 දක්වා පරාසයක ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි. | කොවිඩ් 19 වසංගතය හමුවේ අයවැය ගත ප්‍රතිපාදන ඉතිරි වී ඇති බව. | අමාත්‍යාංශයේ අරමුණු ඉටු කර ගැනීම සඳහා ක්‍රියාත්මක කල හැකි පරිදි සැලසුම් සකස් කිරීමටත්, සැලසුම් අනුව උපයෝජනය කිරීමටත් කටයුතු කළයුතුවීම. |
| (ආ) | උසස් අධ්‍යාපන අංශයේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වැය විෂයයන් 19 කට අදාළ එකතුව රු.131,643,575 ක ප්‍රතිපාදන ඉතිරිව පැවති අතර එය සියයට 30 සිට සියයට 98 දක්වා වූ පරාසයක විය. | 2020 වර්ෂයේ පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය මත කාර්යාල කටයුතු නිසි පරිදි ක්‍රියාත්මක නොවීම, වාහන හා යන්ත්‍ර සූත්‍ර භාවිතයේදී නඩත්තු වියදම් දැරීමට සිදු නොවීම, අරමුණුගත | අමාත්‍යාංශයේ අරමුණු හා පරමාර්ථ ළඟාකරගත හැකි අයුරින් කටයුතු මෙහෙයවීමට ක්‍රියාමාර්ග ගත යුතුවීම |

| | | |
|---|---|---|
| | සංවර්ධන කාර්යයන් සඳහා අපේක්ෂිත පරිදි වියදම් දැරීමට සිදු නොවීම, කාර්ය මණ්ඩලය විදේශ සංචාර වල නිරත නොවීම ආදී කරුණු ප්‍රතිපාදන උපයෝජනය නොවීමට හේතු වී තිබූ බව. | |

2.3 **රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සැසඳුම් ප්‍රකාශය අනුව ස්ථාන මාරුවී ගිය, විශ්‍රාම ගිය, වැඩ තහනම් කළ, සේවය හැර ගිය හා වෙනත් නිලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු ශේෂය රු. 168,315,305 ක් විය. ඉන් වර්ෂ 5 ක් ඉක්මවූ ශේෂය රු. 71,453,543 ක් වූ අතර, එම ශේෂ අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ණය ශේෂ බොහෝමයක් නිරවුල් කර ඇති අතර ඉතිරි ණය ශේෂ ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව. | හිඟහිටි ණය ශේෂ පියවා ගැනීමට හා අයකර ගත හැකි ශේෂ ඉදිරියේදී අයකර ගෙන නිලධාරීන් මුදා හැරීමට කටයුතු කලයුතු වීම. |

**2.4** **බැරකම් හා බැදීම්වලට එළඹීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 2 (අ) හා (ඇ) විධිවිධානවලට පටහැනිව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව රු. 4,623,823,814 ක බැරකම්ද රු.4,746,913,047 ක බැදීම්ද ඇති කරගෙන තිබුණි. | 2020 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල රු. 4,623,823,814 ක බැරකම් හා රු. 4,746,913,047 ක බැදීම් ඇති කරගෙන ඇති බව. | චක්‍රලේඛය අනුව කිසිදු බැරකමක් ඊළඟ වර්ෂය තුලදී නිරවුල් කිරීමේ අරමුණ ඇතිව ඉදිරියට ගෙන නොයා යුතු බව |

| | | | |
|---|---|---|---|
| (ආ) | මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් බැරකම් උපලේඛන අනුව 2018 හා 2019 වර්ෂවලට අදාල රු.4,222,967,796 ක බැරකම් නිරවුල් කිරීමට කටයුතු නොකර සමාලෝචිත වර්ෂයේ බැරකම්වල ඇතුලත් කර තිබුණි. | මෙය නිවැරදි කිරීමට ගිණුම්කරණ ඒකක වෙත උපදෙස් ලබා දී ඇති බව. | බැඳීම් හා බැරකම් ලේඛණ නිවැරදි ලෙස පවත්වාගෙන යාමට කටයුතු කල යුතුවීම. |
| (ඇ) | 2020 වර්ෂය අවසානයේ පැවති රු.289,600 ක් වූ බැරකම්, බැරකම් ප්‍රකාශනයේ ඇතුළත් කර නොතිබුණි. | බැරකම් ලේඛනයෙහි සටහන් කිරීම අතපසු වීමකින් මග හැරී ඇත. මින් ඉදිරියට එවැනි වරදක් ඇති නොවන ලෙස කටයුතු කිරීමට අදාළ නිලධාරීන්ට අවශ්‍ය උපදෙස් ලබා දී ඇති බව. | වර්ෂයට අදාළව පවතින සියලුම බැරකම්, බැරකම් පිළිබඳ ප්‍රකාශයේ ඇතුළත් කළ යුතුවීම. |

**2.5 නීති රෙගුලාසි වලට අනුකූල නොවීම**

--------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | **නිරීක්ෂණය** | | | |
|---|---|---|---|---|
| | **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| (අ) | 1961 අංක 8 දරන උපකෘත පාසැල් හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 25 වන වගන්තිය | අවුරුදු 5 සිට 14 දක්වා සිසුන් සඳහා සාමාන්‍ය අධ්‍යාපනය ලබාදීම වෙනුවෙන් පෞද්ගලික අංශයට පාසැල් ආරම්භ කළ නොහැකි වුවද ඊට පටහැනිව සමාගම් පනත යටතේ ව්‍යාපාර ලෙස පාසැල් ආරම්භකර තිබුණි. | අමාත්‍යාංශයේ ලියාපදිංචි වී නොමැති මෙම පාසල් නියාමනය, අධීක්ෂණය හා නිරීක්ෂණය කිරීමට අමාත්‍යාංශයට නොහැකි වී ඇති බව. | පනතට අනුකූලව කටයුතු කල යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| **(ආ)** 1986 අංක 30 දරණ අධ්‍යාපනික විද්‍යායතන පනත | | | |
| **(i)** 3, 4 හා 5 වගන්ති | "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන අධ්‍යාපනික විද්‍යායතන සඳහා බලතල, කාර්ය හා කර්තව්‍යයන් 18 ක් නියම කර තිබුණි. එවැනි මණ්ඩලයක් 2008 වර්ෂයේ සිට මෙම වාර්තාවේ දින දක්වා ක්‍රියාත්මකව පැවති බවට සාක්ෂි විගණනයේදී නිරීක්ෂණය නොවීය. | අංක ED/03/19/05/02/05 දරණ ලිපි ගොනුවේ 2008 වසර වන විට මණ්ඩල රැස්වීම් වාර්තාව විද්‍යාපීය ශාඛාවේ පවතින අතර, සෙසු වාර්තා සම්බන්ධ ලිපි ගොනු සොයා ගැනීමට නොහැකි බව . | අදාල වාර්තා සුරක්ෂිතව තබා ගැනීමට හා පනත ප්‍රකාරව කටයුතු කිරීම කළ යුතුවීම. |
| **(ii)** 7 වන වගන්තිය | මණ්ඩලයේ ප්‍රධාන කොමසාරිස්වරයා විසින් විද්‍යායතනවල පරිපාලන කටයුතු අධීක්ෂණය කිරීම, කාර්ය මණ්ඩලය පාලනය කිරීම සහ බලතල, කාර්ය හා කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම කළයුතු වුවද පනත ප්‍රකාරව මණ්ඩල පිහිටුවීම මෙන්ම මෙම කටයුතු ක්‍රියාත්මක කිරීමද ප්‍රශස්ථ අයුරින් සිදුවී නොතිබුණි. | දීමනා ගෙවීම සඳහා අනුමැතිය ලැබී නොමැති බැවින් විද්‍යායතන මණ්ඩල රැස්වීම් පැවැත්විය නොහැකි බව. | පනතේ සඳහන් ආකාරයට අදාල මණ්ඩල පිහිටුවීම මෙන්ම එම කටයුතු ක්‍රියාත්මක කිරීමද සිදුකල යුතුවීම. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| **(i)** අංක 104 (3) හා 104 (4) දරන මුදල් රෙගුලාසි | වාහන අනතුරු 39 ක ප්‍රාරම්භක වාර්තා ඉදිරිපත් කිරීමට දින 11 සිට දින 310 දක්වාද, වාහන අනතුරු 36 ක පරිපූර්ණ වාර්තා ඉදිරිපත් කිරීමට දින 88 සිට දින | ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව . | මුදල් රෙගුලාසි අනුව අප්‍රමාදව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| | 3,498 ක් දක්වාද ප්‍රමාද කිරීම නිසා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමද ප්‍රමාද වී තිබුණි. එසේම භාණ්ඩ සොරකම් හා අලාභ හානි 3 ක ප්‍රාරම්භක වාර්තා දින 2,675 දක්වාද, පරිපූරණ වාර්තා දින 7,869 දක්වාද ප්‍රමාද කර තිබුණි. | | |
| (ii) 571 (2) දරන මුදල් රෙගුලාසිය | සමාලෝචිත වර්ෂය අවසන් දිනට පැවති රු.26,602,335 කොන්ත්‍රාත් රැඳවුම් මුදල් අදාළ මුදල් රෙගුලාසි ප්‍රකාරව රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාළ නිර්දේශයන් ලබාගෙන කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවීම් කිරීමට හෝ රාජ්‍ය ආදායමට බැර කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇති බව. | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. |
| (ඇ) 2008 සැප්තැම්බර් 19 දිනැති අංක 37/2008 දරන අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛය | | | |
| (i) 2.1 ඡේදය | 2 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා පන්තිවල ශිෂ්‍ය සංඛ්‍යාව, පළමුවන ශ්‍රේණියට ඇතුළත් වන අවස්ථාවේදී එම පන්තියට ඇතුළත් කල උපරිම ශිෂ්‍ය සංඛ්‍යාවට සීමා කල යුතු වුවද, මහනුවර මහමායා බාලිකා විද්‍යාලයේ උක්ත ශ්‍රේණිවලට අදාළ පන්ති 09 ක නියමිත සීමාව | පිළිතුරු ලබා දී නැත. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කල යුතුවීම |

| | | | | |
|---|---|---|---|---|
| | | ඉක්මවා සිටි සිසුන් සංඛ්‍යාව 03 ත් 04 ත් දක්වා විය. තවද 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා එක් පන්තියක ශිෂ්‍ය සංඛ්‍යාව 45 ට සීමා කල යුතු බව දක්වා තිබුණද පන්ති 08 ක එම සීමාව ඉක්මවා සිසුන් 05 ත් 16 ත් දක්වා වූ සංඛ්‍යාවක් ඇතුළත් කරගෙන තිබුණි. | | |
| (ii) | 3.1, 3.2, 3.3 හා 3.4 ඡේද | 2ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා පුරප්පාඩු පවතින පන්තිවලට ළමුන් අළුතෙන් ඇතුලත් කර ගැනීම සඳහා වූ චක්‍රලේඛ විධිවිධාන අනුගමනය නොකර**,** අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ ලිපි මඟින් කළ දැනුම්දීම් අනුව 2019 සහ 2020 වර්ෂවල තුළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ 2 සිට 4 ශ්‍රේණිය දක්වා දරුවන් ඇතුලත් කළ අවස්ථා 21 ක් පැවතුණි. | පිළිතුරු ලබා දී නැත | -එම- |
| **(ඉ)** | 2009 නොවැම්බර් 17 දිනැති අංක 2009/35 දරණ අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛය | | | |
| **(i)** | 3 වන ඡේදය | රජයේ අනුමත පෞද්ගලික පාසල් විසින් අදාළ චක්‍රලේඛ උපදෙස් හා විධිවිධාන පිළිපදින්නේද යන්න සොයා බැලීම සඳහා විධිමත් හා අඛණ්ඩ නියාමනයක් ක්‍රියාත්මකව නොතිබුණි | ඉදිරියේදී මේ පිළිබඳව දැනුවත් කිරීමට අපේක්ෂා කරන බව | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| | **(ii)** 4 (අ) **(i)** ඡේදය | රජයේ අනුමත සෑම පෞද්ගලික පාසලකම ඉගැනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය විධිමත්ව ඉටු කිරීම සඳහා සෑම වසරක් වෙනුවෙන්ම කාල සටහනක් සකස් කර ඊට පෙර වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පෙර කලාප, පළාත් හෝ පෞද්ගලික පාසැල් අධ්‍යක්‍ෂගේ අනුමැතිය ලබාගත යුතු වුවද, බොහෝමයක් පාසැල් එසේ සිදුකර නොතිබුණි. | මේ දක්වා අවධානයක් දක්වා නැත. ඉදිරියේදී අවධානය යොමු කරවීමට අපේක්ෂා කරන බව | -එම- |
| **(ඊ)** | 2016 ජනවාරි 07 දිනැති අංක 01/2016 දරන අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛයේ 7.3 ඡේදය | පළාත් අධ්‍යාපන ලේකම් විසින් පළාත් පාසැල් සඳහා අවශ්‍ය අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාගෙන නොතිබීම හේතුවෙන් පළාත් අධ්‍යාපන ගුරු පුරප්පාඩු ලේඛනයට අනුව නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන ඒකකවල ගුරු පුරප්පාඩු 651 ක් පැවතුණි. | විගණන විමසුම හා එකඟ වේ. සැබෑ ලෙස ම විශේෂ අධ්‍යාපන ගුරු පුරප්පාඩු සඳහා 2021.02.15 දින 21 දෙනෙකු බඳවාගත් අතර ඒ අනුව දැනට පුරප්පාඩු 676 ක් පවතී. | -එම- |
| **(උ)** | 2020 දෙසැම්බර් 03 දිනැති අංක 37/2020 දරන අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛයේ උපදෙස් හා සංග්‍රහයේ 12 වැනි පරිච්ඡේදය | විශේෂ අධ්‍යාපන ක්‍ෂේත්‍රයේ සඳහා ගුරු පත්වීම ලැබූ ගුරුභවතුන් එම ක්‍ෂේත්‍රයෙහිම පූර්ණ කාලීනව සේවයේ යෙදිය යුතුය. එහෙත් විගණනයට ඉදිරිපත් කල තොරතුරු අනුව දිවයිනේ විශේෂ අධ්‍යාපන ක්‍ෂේත්‍රය සඳහා ගුරු පත්වීම් ලබා තිබුණු ගුරුවරුන් 207 දෙනෙකු එම ක්‍ෂේත්‍රයේ ඉගැන්වීම් කටයුතුවල නොයෙදෙන බව නිරීක්‍ෂණය විය. | ඉදිරියේදී විශේෂ අධ්‍යාපන ක්ෂේත්‍රයේ යෙදවීම සඳහා උපදෙස් ලබා දී ඇති බව. | -එම- |

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධ්‍යාපන අමාත්‍යාංශ කාර්යභාරය අනුව ලෝක තරඟකාරීත්වයට ආත්ම විශ්වාසයකින් හා සාර්ථකත්වය පිළිබඳ විශ්වාසයකින් යුතුව ප්‍රවේශ වීමට හැකියාව ඇති කරවන අන්දමේ ජාතික අධ්‍යාපන ක්‍රමයක් නිර්මාණය කිරීමේ කාර්යය සම්පූර්ණයෙන් ඉටු කිරීමට නොහැකි වී තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත | ලංකාවේ අධ්‍යාපනය සඳහා නොවෙනස් ජාතික ප්‍රතිපත්තියක් වර්තමානයට ගැලපෙන අයුරින් සකස් කල යුතුවීම. |
| (ආ) | 1991 අප්‍රේල් 19 දිනැති 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතේ විධිවිධාන අනුව ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තීන් සකස් කිරීම සඳහා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් 1992, 2003 සහ 2016 වර්ෂවලදී නිර්දේශ ඉදිරිපත් කර තිබුණු නමුත් 2020 වර්ෂය අවසාන වන විටද ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සකස් කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත | ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සකස් කල යුතුවීම. |
| (ඇ) | 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ III වන පරිශිෂ්ඨයේ අධ්‍යාපනයට අදාලව 2 වන ව්‍යවස්ථාව අනුව පෙර පාසල් අධීක්ෂණය හා කළමනාකරණය කිරීමේ අයිතිය අධ්‍යාපන අමාත්‍යාංශයට පවරා තිබූ අතර, අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයක් වශයෙන් හඳුනාගෙන තිබුණ පෙර පාසල් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සම්පාදනය කර ක්‍රියාත්මක කිරීම සිදු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත | පෙර පාසල් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සම්පාදනය කර ක්‍රියාත්මක කිරීම කල යුතුවීම. |

## 3.2 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අ.පො.ස. (සා.පෙළ) හා අ.පො.ස. (උසස් පෙළ) පන්තිවල තාක්‍ෂණ විෂය උගන්වන ගුරු ඌණතාවය අවම කිරීම, තාක්‍ෂණ විෂය හදාරන සිසුන්ට ගුරු තාක්‍ෂණලාභීන් ලෙස උසස් අධ්‍යාපනය ලැබීමට අවස්ථාව සැලසීම, තාක්‍ෂණ විෂය උගන්වන ගුරුවරුන්ට තම වෘත්තිය සංවර්ධනය සඳහා තාක්‍ෂණ විෂයට අදාළව ගුරු පුහුණුව ලබාදීම ආදී කරුණු පදනම් කරගනිමින් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයක් ඉදිකිරීම සඳහා 2017 ජනවාරි 18 දිනැති අංක අමප/16/2647/742/036-1 දරණ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සඳහා අනුමැතිය ලබාදී තිබුණි. 2017 අප්‍රේල් 19 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පල කරනු ලැබූ 2017 අංක 93 දරණ ආඥාවේ සඳහන් දැන්වීම මගින් අදාළ ඉදිකිරීම සඳහා කුලියාපිටිය බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් නාරංගොල්ල ප්‍රදේශයේ ඉඩමක භුක්තිය අධ්‍යාපන ලේකම්වරයා වෙත පවරා ගැනීම පමණක් සිදුකර තිබුණි. කොරියානු රජයේ ආධාර මත ඉදිකිරීමට සැලසුම් කරන ලද මෙම ව්‍යාපෘතිය සඳහා 2019 සහ 2020 වර්ෂයන් තුල මුල්ගල් තැබීම ඇතුළු වියදම් සඳහා ළඟම පාසල<br><br>හොඳම පාසල ව්‍යාපෘතිය මගින් රු.15,366,316 ක මුදලක් වැයකර තිබුණද, ව්‍යාපෘතියේ වැඩ කටයුතු මේ වන විට නවතාදමා තිබුණි. | තාක්ෂණවේදී ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය ඉදි කිරීම සඳහා ඉදිරි තීරණ ගනිමින් පවති | අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය ඉදිකිරීම සඳහා ක්‍රියා කල යුතුවීම. |
| (ආ) | කරාපිටිය රෝහලේ මහාචාර්ය ඒකකයක් පිහිටුවීමේ ව්‍යාපෘතිය රු.මිලියන 1300 ක පිරිවැය ඇස්තමේන්තුවකින් යුතුව 2018 වර්ෂයේ ආරම්භ කර 2022 මැයි 31 දින වනවිට නිම කළ යුතුව තිබුණි. 2019 වර්ෂයේදී ලංසු ප්‍රදානය කිරීම සිදුකර රු.මිලියන 131.7ක අත්තිකාරම් මුදලක් ද කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වනවිට ව්‍යුහාත්මක කටයුතු පමණක් ආරම්භ කර තිබුණි. | ඉදිකිරීම් කටයුතු කිරීමට යෝජිත ඉඩම සෞඛ්‍ය අමාත්‍යාංශය වෙතින් පවරා ගත යුතු වූ බැවින් එම කටයුතු 2019. ඔක්තෝබර් 28 දින වනවිට නිම කිරීමට හැකි විය. ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කිරීම වෙනුවෙන් 2019 දෙසැම්බර් 17 දින | නියමිත කාලපරිච්ඡේදය තුළ දී ව්‍යාපෘති කටයුතු නිම කර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | කොන්ත්‍රාත්කරුවෙත වැඩබිම භාරදෙන ලද අතර 2020 වර්ෂයේදී මූලිකව භූමිය සැකසීම ආදී කටයුතු පමණක් සිදුකරන ලද අතර 2021 ජූලි පමණ වනවිට සියයට 20 පමණ භෞතික ප්‍රගතියක් ළඟාකරගෙන ඇත. | |
| (ඇ) | 2018 වර්ෂයේ අයවැය යෝජනා යටතේ රු.මිලියන 943 ක ඇස්තමේන්තුවක් මත,රුහුණු විශ්වවිද්‍යාලයේ නාවුක අධ්‍යයන හා නාවික කටයුතු පිළිබඳ ඒකකයක් පිහිටුවීමට අදාළ ව්‍යාපෘතිය මාස 36 කින් වැඩ නිම කළ යුතුව තිබුණි. එහෙත් ව්‍යාපෘතියට අදාළ මූලික වැඩ කටයුතු පමණක් 2019 වර්ෂයේ ආරම්භ කර තිබුණි. එසේම සමාලෝචිත වර්ෂය අවසන් වනවිට රු මිලියන 146.9 ක ප්‍රතිපාදන සලසා දී තිබුණ ද, ඉන් රු.මිලියන 90.9 ක් වැය කර ව්‍යුහාත්මක වැඩ කටයුතු පමණක් ආරම්භ කර තිබූ අතර භෞතික ප්‍රගතිය සියයට 29 ක් වැනි පහළ මට්ටමක පැවතුණි. | හපුගල හා මාගාල්ල යන ස්ථාන දෙකේ ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතියේ මහල් 04 කින් යුත් ගොඩනැගිල්ලක් ඉදිකෙරෙන මාගාල්ල වැඩ බිම, කොන්ත්‍රාත්කරු වෙත භාරදීම ප්‍රමාද විය. 2019 වසර සඳහා රු.මිලියන 146.9 ක ප්‍රතිපාදන සලසා තිබුණ ද ඉන් වැයකිරීමට හැකි වූයේ හපුගල භූමියේ ඉදි කෙරෙන මූලික වැඩ කටයුතු සඳහා රු.මිලියන 90.9 ක මුදලක් පමණි. මාගාල්ල භූමියේ ඉදිකෙරෙන මහල් 04කින් යුත් ගොඩනැගිල්ලේ සියයට 55 ක (2021 ජුනි පමණ වනවිට) භෞතික ප්‍රගතියක් ළඟාකරගෙන ඇත. | ඉදිකිරීම් ව්‍යාපෘති ප්‍රමාදයකින් තොරව නිම කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | ඇස්තමේන්තු ගත වටිනාකම රු.මිලියන 1,180 ක් වූ රුහුණු විශ්වවිද්‍යාලයේ මහල් 12 කින් යුත් වෛද්‍ය පීඨ ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2018 මුල් කාර්තුව තුළ ආරම්භ කර 2020 ජනවාරි 10 දින වනවිට නිමකළ යුතුව තිබූ අතර ඒ වෙනුවෙන් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස 2018 ජනවාරි 17 දින රු.මිලියන 195.5 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. මෙම ව්‍යාපෘතිය කරගෙන යාමේ අඩු ප්‍රගතිය හේතුවෙන් 2019 දෙසැම්බර් 23 දින | මෙම ව්‍යාපෘතිය 2020 ජනවාරි 10 දින වනවිට නිම කළ යුතුව තිබුණ ද ව්‍යාපෘතිය කරගෙන යාමේ අඩු ප්‍රගතිය හේතුවෙන් 2019 දෙසැම්බර් 23 වන දින කොන්ත්‍රාත් ගිවිසුම අවලංගු කර 2020.05.06 දින ඉංජිනේරු කාර්යයන් | ව්‍යාපෘති ඉටු කිරීම වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීමේදී ඔවුන්ගේ පූර්ව කොන්ත්‍රාත් ඉටු කිරීමේ සාර්ථකභාවය පිළිබඳ නිසි අවබෝධයකින් යුතුව කටයුතු කළ යුතු අතර ගෙවා ඇති අත්තිකාරම් මුදල් |

| | | | |
|---|---|---|---|
| | කොන්ත්‍රාත් ගිවිසුම අවලංගු කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත වෙනත් ඉදිකිරීම් ආයතනයකට නැවත ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. මෙසේ කොන්ත්‍රාත් ගිවිසුම අහෝසි කිරීම හේතුවෙන් කොන්ත්‍රාත්කරුගෙන් තව දුරටත් අය කර ගත යුතුව තිබූ රු.මිලියන 155.3 ක් වූ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ශේෂය, අදාළ බැංකු සුරක්ෂණය මුදල් කරන ලෙස බැංකුව වෙත දැනුම් දීම ප්‍රමාද වීම හේතුවෙන් පියවා ගැනීමට තිබූ අවස්ථාව ද අහිමි වී තිබුණි. | පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යංශය වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලදී. අත්තිකාරම් සුරක්ෂණය මුදල් කිරීම සඳහා 2019.12.30 දින ලංකා බැංකුව වෙත යවා තිබූ නමුත් එම අත්තිකාරම් ඇපකරය සහ කාර්යයසාධන ඇපකරය ලබා ගැනීමට විරුද්ධව අතුරු තහනම් නියෝගයක් කොළඹ වාණිජමහ අධිකරණය විසින් නිකුත් කර තිබුණි. ඒ අනුව විශ්වවිද්‍යාලය විසින් කර ඇති ඉල්ලීම ඉටු කළ නොහැකි බව ලංකා බැංකුව විසින් 2020 ජනවාරි 16 දින දන්වා තිබුණි. මේ සම්බන්ධව රුහුණු විශ්වවිද්‍යාලය විසින් නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි 2020.06.10 දින වාණිජ මහ අධිකරණය ඉදිරයේ විරෝධතා ගොනු කර ඇත. | අත්තිකාරම් සුරක්ෂණයෙන් පියවා ගැනීමට අදාළ ක්‍රියාමාර්ග ප්‍රමාදයකින් තොරව ගත යුතුය. |
| (ඉ) | ශ්‍රී ලංකා රජයේ හා කුවේට් රජයේ ආධාර ඇතිව සුනාමියෙන් විපතට පත් පළාත්වල පිහිටි විශ්වවිද්‍යාලයන් ප්‍රතිසංස්කරණය හා නැවත ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2019 වර්ෂයේ දෙසැම්බර් මාසයේ දී අවසන්වීමට නියමිතව තිබූ නමුත් 2020 දෙසැම්බර් 31 දින දක්වා කාලය දීර්ඝ කර තිබුණි. මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළව රු.මිලියන 93.20 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණද ව්‍යාපෘතිය වෙනුවෙන් උපයේජනය කර තිබූ මුදල රු. මිලියන 57.3 ක් පමණක් වූ අතර ඒ වනවිට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 65 ක් වැනි පහළ මට්ටමක පැවතුණි. | පවතින කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් ව්‍යාපෘති කාර්යයන් නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට බාධා පැමිණීම නිසා ව්‍යාපෘති කාල සීමාව අවසන් වීමට නියමිතව තිබූ 2020 දෙසැම්බර් 31 වන විට අදාළ ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් අවසන් කිරීමට නොහැකි වුවද රු.මිලියන 57.35 ක වියදම් වාර්ථා කිරීමට හැකි විය. | ව්‍යාපෘති නියමිත කාලය තුළ නිම කිරීමට කළමනාකරණයේ අවධානය යොමු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | ශ්‍රී ලංකා රජයේ හා සෞදි රජයේ ආධාර යටතේ ක්‍රියාත්මක වන වයඹ විශ්වවිද්‍යාලීය නගර සංවර්ධන ව්‍යාපෘතිය 2017 අගෝස්තු ආරම්භ කර සමාලෝචිත වර්ෂය අවසන් වනවිට වසර 03 ½ ආසන්න කාලයක් ගත වී තිබුණ ද රු.මිලියන 11 ක් උපයෝජනය කර ලඟා කර ගෙන තිබූ භෞතික ප්‍රගතිය සියයට 5 ක් වැනි පහළ මට්ටමක පැවතුණි | 2020 වර්ෂයේ නොවැළැක්විය හැකි හේතු මත මාස 10 ක් ප්‍රමාද වූ අතර එසේම අදාළ අනුමැතිය ලබා ගැනීමටද කාලයක් ගත කිරීමට සිදු විය. මෙම කටයුතු 2020 වර්ෂයේ මුල් කාලයේ ඉටු කරන ලද අතර ඉන් අනතුරුව කොරෝනා වසංගත තත්ත්වම මත තව දුරටත් කටයුතු ප්‍රමාද විය. මේ වනවිට ගොඩනැගිලි ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනිමට කටයුතු කරමින් පවතී. | ගිවිසුම් වලට එළඹීමට පෙර ව්‍යාපෘතියට අදාළව ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ හැකියාව තහවුරු කරගෙන ව්‍යාපෘතිය ආරම්භ කර එහි අරමුණු හා පරමාර්ථ ඉටුකර ගත හැකි ලෙස ව්‍යාපෘති කඩිනමින් නිම කිරීමට අවධානය යොමු කළ යුතුය. |

3.3 **වෙනත් නිරීක්ෂණ**

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | 2008 සැප්තැම්බර් 24 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ අංක අමප/08/1742/316/086 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාව පිහිටුවා තිබුණද, ඊට අදාළ කෙටුම්පත් පනත 2008 ඔක්තෝබර් 29 දින නීති කෙටුම්පත් සම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබුණු නමුත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විටද පනතේ කටයුතු අවසන් කර නොතිබුණි. | මෙම කාර්යය කඩිනම් කර ගැනීම සඳහා ලිඛිතව ඉල්ලීමක් නීති කෙටුම්පත් දෙපාර්ත මේන්තුව වෙත යොමු කර ඇතිබව. | කඩිනමින් පනත් කෙටුම්පත සඳහා නීති කෙටුම්පත් සම්පාදන දෙපාර්තමේන්තුවේ නිර්දේශ ලබා යුතුවීම. |
| (ආ) | ශ්‍රී ලංකා යුනෙස්කෝ කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය පත්කිරීම හා ගෙවීම් කිරීම මෙම පනතට අනුව සිදුකල යුතු නමුත්, පනත අනුමතව නොතිබියදී, | විගණන විමසුම හා එකඟ වන බව. | පනත සම්මත කර එහි ඇතුලත් ආකාරයට කටයුතු කල යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| | 2008 සැප්තැම්බර් මස 24 දිනැති අංක අමප/08/1742/316/086 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත කොමිෂන් සභාවට කාර්ය මණ්ඩලයක් පත් කර ගෙවීම් සිදුකර තිබුණි. තවද, ප්‍රංශයේ පැරිස් නුවර පිහිටි යුනෙස්කෝ නිත්‍ය නියෝජිත කාර්යාලය වෙත සම්බන්ධීකරණ නිලධාරියෙකු අනුයුක්ත කර පාරිශ්‍රමික වශයෙන් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එකතුව රු. මිලියන 45.85 ක ප්‍රතිපාදන අධ්‍යාපන අමාත්‍යාංශය විසින් විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත මුදාහැර තිබුණි. | | |
| (ඇ) | රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන වල ආයතනික හා විෂය සමාලෝචිත කටයුතු වෙනුවෙන් උපයෝජනය කිරීම සඳහා 2013 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ එම ආයතන විසින් තැන්පත් කරන ලද රු. 5,200,000 ක් අදාළ අරමුණු වෙනුවෙන් උපයෝජනය කිරීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි. | විගණකාධිපතිගේ නිරීක්ෂණ ද සැලකිල්ලට ගෙන එම අයකරගන්නා අරමුදල් රජයේ ආදායමට බැර කිරීමටත්, රාජ්‍ය නොවන උසස් උධ්‍යාපන ආයතන සමාලෝචන කාර්යයන් වෙනුවෙන් වන වියදම් දැරීම සඳහා වැය විෂයයක් යටතේ අයවැය ඇස්තමේන්තු මඟින් වාර්ෂිකව ප්‍රතිපාදන සලසා ගැනීමටත් අවශ්‍ය උපදෙස් ලබා දෙන ලෙස භාණ්ඩාගාරයෙන් විමසීම් කර ඇත. | තැන්පතුවල ඇති මුදල් අදාළ අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් උපයෝජනය කළ යුතුය. |

## 3.4 ප්‍රසම්පාදනයන්

------------------

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සහ ගුරු මධ්‍යස්ථාන සඳහා සුහුරු පන්ති කාමර උපකරණ ප්‍රසම්පාදන සඳහා සැපයුම්කරු සමඟ එළඹි ගිවිසුම අනුව 2020 | ගිවිසුම අනුව සැපයුම්කරු විසින් 2020.03.10 දිනට | ගිවිසුම අනුව ප්‍රමාද ගාස්තු අය කල |

| | | |
|---|---|---|
| මාර්තු 10 දිනට පෙර උපකරණ අදාළ ගුරු මධ්‍යස්ථාන හා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ වෙත සපයා අවසන් කලයුතු වුවත්, සැපයුම්කරු භාණ්ඩ සැපයීම සඳහා සති 20 කට අධික කාලයක් ප්‍රමාද කර තිබුණි. ඒ අනුව කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 10 ක ප්‍රමාද ගාස්තු වන රු.3,844,872 මුදල අයකර නොගෙන සැපයුම්කරුට ගෙවීම් කර තිබුණි. | පෙර භාණ්ඩ සපයා අවසන් කලයුතු වුවත් භාණ්ඩ සැපයීම අවසන් කර ඇත්තේ 2020.09.23 දින බවද පිළිගන්නා බව. | යුතුවීම. |

## 3.5 වත්කම් කළමනාකරණය

----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට අයත් වාහන 11 ක් අමාත්‍යාංශය භාවිතයට ගෙන තිබුණු අතර, අමාත්‍යාංශයට අයත් වාහන 22 ක් වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත පවරා තිබුණි. මෝටර් රථ ලියාපදිංචි සහතික මුල් පිටපත නොමැතිව අමාත්‍යාංශය භාවිතයට ගන්නා වාහන 11 ක් පවරා ගැනීමට හෝ නීත්‍යානුකූල අයිතිය හිමි ආයතන වෙත ලබාදීමට හෝ කටයුතු කර නොතිබුණි. | පවරා ගැනීමට හා පවරා දීමට කටයුතු කරන බව. | අමාත්‍යාංශය විසින් භාවිතාකරන වෙනත් ආයතන සතු වාහන හා වෙනත් ආයතන භාවිතාකරන අමාත්‍යාංශ වාහන නීත්‍යානුකූලව පවරා ගැනීමට හෝ පවරා දීමට කටයුතු කල යුතුවීම. |
| (ආ) | අමාත්‍යාංශය සතුව පැවති මූල්‍ය නොවන වත්කම් අතුරින් වාහන 40 ක් රාජ්‍ය අමාත්‍යාංශය වෙත තාවකාලිකව පවරා දී තිබුණද, රාජ්‍ය අමාත්‍යාංශ වෙත ලබාදීමට යෝජිත අනෙකුත් මූල්‍ය නොවන වත්කම් තවදුරටත් හදුනා ගනිමින් පැවතීම නිසා එම වත්කම් විගණන දිනය වන විටත් පවරා දී නොතිබුණි. | වත්කම් පවරා දීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | අධ්‍යාපන අමාත්‍යාංශය විසින් රාජ්‍ය අමාත්‍යාංශ වෙත ලබා දුන් වත්කම් පවරා දිය යුතුවීම. |

## 3.6 පාඩු හා හානි

-----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 109 ප්‍රකාරව සියළුම පාඩු හා අත්හැරීම් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවත්, රු. 3,034,778 ක් වටිනා අනතුරු 33 ක් සම්බන්ධයෙන් සිදු වූ පාඩු හා අත්හැරීම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ඉදිරියේදී වාර්තා සකස් කිරිමට නිලධාරින්ට උපදෙස් ලබාදෙන ලද බව | සියලුම පාඩු හා අත්හැරීම් මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතුවීම. |
| (ආ) | 2011 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වර්ෂ 8 ක් තුල සිදුවූ රු. 4,742,030 ක් වූ පාඩු හා අත්හැරීම් අවස්ථා 40 ක් ආරම්භක කපා නොහල ශේෂය යටතේ දක්වා නොතිබුණි | ඉදිරියේදී වාර්තා සකස් කිරිමට නිලධාරින්ට උපදෙස් ලබාදෙන ලද බව | පාඩු හා අත්හැරීම් සිදුවූ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් කල යුතුවීම. |

## 3.7 අනාර්ථික ගණුදෙනු

--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සඳහා ටොයොටා හයිලක්ස් වර්ගයේ ඩබල් කැබ් රථ 20 ක් 2017 දෙසැම්බර් 11 දින කුලී පදනම මත ලබාගෙන තිබුණු අතර, එදින සිට 2020 නොවැම්බර් 24 දක්වා රු. 137,219,886 ක මුදලක් කුලී වශයෙන් ගෙවා තිබුණද, කුලී ගිවිසුම් ප්‍රකාරව එම වාහන මාසිකව ධාවනය කලයුතුව තිබූ කිලෝමීටර් 3,000 ක් වූ අවම කිලෝමීටර් ප්‍රමාණයවත් ධාවනය කර නොතිබුණි. | වාහන මාසිකව ධාවනය කල යුතු අවම කිලෝමීටර් ප්‍රමාණය ධාවනය කර නොතිබුනද සැලකිවයුතු ප්‍රමාණයක් ධාවනය කර ඇති බව | ආයතනයට වඩාත් වාසිදායක ලෙස කුලී ගිවිසුම් වලට එළඹීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2017, 2018 හා 2019 වර්ෂවල අමාත්‍යාංශය සතු වාහන සඳහා ඉන්ධන, අළුත්වැඩියා සහ රියදුරු අතිකාල ඇතුලත්ව එක් වාහනයක දළ වාර්ෂික වියදම පිළිවෙලින් රු. 639,480 ක් රු. 703,045 ක් සහ රු. 625,770 ක් විය. කුලී පදනම මත අවස්ථා දෙකකදී වාහන 07 ක් ලබාගෙන තිබුණු අතර, එක් වාහනයක වාර්ෂික වියදම රු.5,844,300 ක් වී තිබුණි. අනෙක් වාහන 6 න් එක් වාහනයක් සඳහා වාර්ෂික වියදම රු. 2,649,600 වී තිබුණි. වාහනයක කුලි වියදම අමාත්‍යාංශය සතු වාහන නඩත්තු පිරිවැය මෙන් සියයට 400 ක් වී තිබුණු අතර, කුලී පදනම මත වාහන ලබාගැනීම ආර්ථිකමය වශයෙන් ඵලදායීත්වයකින් යුක්ත ගණුදෙනුවක් වශයෙන් විගණනයේදි නිරීක්ෂණය නොවුණි. | ජාතික අයවැය චක්‍රලේඛ 1/2016 ට අනුව වාහන මිලදී නොගෙන කුලී පදනම මත වාහන ලබා ගැනීමට කටයුතු කර ඇති බව | වාහන උපයෝජනය ආර්ථිකමය වශයෙන් ඵලදායීව සිදුකල යුතුවීම. |

## 3.8 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ පද්ධතියේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක සංවර්ධනය සඳහා තීරණ ගැනීම, සැලසුම්කරණය හා මූල්‍ය කළමනාකරණය ආදියේදී විද්‍යාපීඨවල පාරදෘශ්‍යභාවය හා වගවීම වඩාත් තහවුරු වන පරිදි කටයුතු කිරීම සඳහාත් විනිවිදභාවයකින් යුක්ත වූ කාර්යක්‍ෂමව හා නිවැරදිව ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම මගින් සම්පත් උපයෝජනයේ ප්‍රශස්ථභාවය සඳහාත් විධිමත් මාර්ගෝපදේශයක් වශයෙන් විද්‍යාපීඨ සංග්‍රහයක් නිකුත් විය යුතු වුවද, 2020 වර්ෂය වන විටද විධිමත් නීතිමය විද්‍යාපීඨ සංග්‍රහයක් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කර නොතිබුණි. | විශ්වවිද්‍යාල උපාධියක් දක්වා උසස් කිරීමේ යෝජනාවක් ඉදිරිපත් වී ඇති බැවින් කෙටුම්පත් විද්‍යාපීඨ සංග්‍රයේ වෙනස්කම් සිදු වේ යැයි අපේක්ෂිත නිසා එම කෙටුම්පත් විද්‍යාපීඨ සංග්‍රහය අවසන් කර නොමැති බව | මාර්ගෝපදේශයක් වශයෙන් විද්‍යාපීඨ සංග්‍රහයක් නිකුත් කල යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ගුරු වෘත්තිය සංවර්ධන මධ්‍යස්ථානවලට දුරකථන පහසුකම් හා අන්තර්ජාල පහසුකම් නොමැති වීම, කථිකාචාර්යවරු හා සම්පත්දායකයින් නොමැති වීම, තාක්‍ෂණික දැනුම නොමැතිවීම, වියදම් ප්‍රතිපූර්ණ ප්‍රමාදවීම් පිළිබඳ නිසි අධ්‍යානයකින් තොරව එම මධ්‍යස්ථානවල පුහුණු වැඩසටහන් මාර්ගගත ක්‍රමයට සිදුකිරීම සඳහා උපදෙස් ලබාදී තිබීම වැනි කරුණු හේතුවෙන් පුහුණු කාර්යයන් අසාර්ථක වී තිබුණද, එම මධ්‍යස්ථානවල පවතින ගැටළු සඳහා විසඳුම් අමාත්‍යාංශය විසින් ලබාදී නොතිබුණි. | රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන අවශ්‍ය පහසුකම් සැලසීමට කටයුතු කරන බව | ගුරු වෘත්තිය සංවර්ධන මධ්‍යස්ථානවල පවතින ගැටළු විසඳා ගැනීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දිය යුතුවීම |
| (ඇ) | ගුරු ශික්‍ෂණලාභීන් පුහුණු කිරීම සඳහා අධ්‍යාපන විද්‍යාපීඨ 19 ක් පිහිටුවා ඇති අතර, ඒ සඳහා වාර්ෂිකව රු.මිලියන 2,500 කට අධිකවූ මුදලක් ඒකාබද්ධ අරමුදලින් වැයකරනු ලබයි. එහෙත් අධ්‍යාපන විද්‍යාපීඨ සඳහා ශික්‍ෂණලාභීන් වාර්ෂිකව ඇතුලත් කරගැනීමේදී අ.පො.ස උසස් පෙළ විභාගය පවත්වා වර්ෂ 3 කට ආසන්න කාලයක් ගතවී තිබුණු අතර, 2018 හා 2019 වර්ෂවල පැවැත්වූ විභාගවලින් මෙම වාර්තාවේ දින දක්වා ශික්‍ෂණලාභීන් ඇතුලත් කරගැනීමට කටයුතු කර නොතිබුණි | Z ලකුණ තීරණය කිරීමේ දි මතුවන ගැටළු මත අධිකරණ ක්‍රියාවන්ට යොමු වීම නිසා අදාල බඳවා ගැනීම් කාලපරාසය වෙනස්වීමට හේතුවී ඇති බව | ප්‍රමාදයකින් තොරව ගුරු ශික්‍ෂණලාභීන් විද්‍යාපීඨවලට ඇතුලත් කරගැනීමට කටයුතු කල යුතුවීම. |
| (ඈ) | දකුණු පළාත් මුලටියන කලාප අධ්‍යාපන කාර්යාලයේ ගුරුවරුන් දෙදෙනෙකුගේ විනය පරීක්‍ෂණ හේතුවෙන් විශ්‍රාම පාරිතෝෂික මුදල වන රු. 453,642 ක් හා 321,390 ක් 2014 වර්ෂයේ සිට රඳවා තබාගෙන තිබුණු අතර, වසර 06 ක් අවසන් වුවද, විනය පරීක්‍ෂණ කටයුතු අවසන් කර විසඳුමක් ලබාදීමට කටයුතු කර නොතිබුණි. | පරීක්ෂණ අවසන් වූ වහාම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කරනු ලබන බව. | විනය පරීක්‍ෂණ කටයුතු අවසන් කර ඉක්මණින් විසඳුමක් ලබාදීමට කටයුතු කල යුතුවීම. |
| (ඉ) | බස්නාහිර, උතුරුමැද හා සබරගමුව පළාත්වල ලබාදුන් ශිෂ්‍යාධාර පිළිවෙලින් රු.80,000 ක්, රු. 248,777 ක් හා රු. 23,500 ලෙස ගිණුම් අංක වැරදීම නිසා හරවා එවා වසර 2 ට වැඩි කාලයක් පොදු තැන්පත් ගිණුමේ රඳවා තබාගෙන තිබුණි. ඊට හේතු සොයා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි | ශේෂ නිරවුල් කිරීම සඳහා තවදුරටත් කටයුතු කරනු ලබන බව | රඳවා ගෙන ඇති ශිෂ්‍යාධාර නිරවුල් කිරීමට කටයුතු කල යුතුවීම. |

| | | |
|---|---|---|
| (ඊ) ඌව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය - බණ්ඩාරවෙලහි පොදු තැන්පත් කාල විශ්ලේෂණ වාර්තාව අනුව 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා තැන්පත් කරන ලද රු.540,500 ක මුදලින් නිරවුල් නොකළ රු.128,900 ක් පැවතුණි. ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය පවත්වන තුරු ඇප තැන්පත් නිරවුල් කිරීමට නොහැකිවීම හේතුවෙන් වසර 05 වැඩි කාලයක් තැන්පතු පැවතුණද ශිෂ්‍යයින් කොටසකට තැන්පත් නිරවුල්කර කොටසකට නිරවුල් නොකිරීමට හේතුව විගණනයට පැහැදිලි නොවුණි. | එම ශේෂය නොපමාව නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබන බව. | තැන්පතු ශේෂ නොපමාව නිරවුල් කල යුතුවීම |

## 4. තිරසර සංවර්ධන අරමුණු හඳුනාගැනීම

-----------------------------------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් දැනුවත් වී තිබුණු නමුත්, එහි කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවීමේ වැඩ පිළිවෙල සැලසුම්වලට ඇතුළත් කර එම ඉලක්ක කරා ළඟ විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන එම ඉලක්ක කරා ලඟා විය යුතුවීම. |

## 5. මානව සම්පත් කළමනාකරණය

-------------------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජොෂ්ඨ සහ ද්විතීයික මට්ටමේ නිලධාරීන් පුරප්පාඩු 1,664 ක් පැවතීම හේතුවෙන් කළමනාකරණ තීරණ ගැනීමේදීද අනෙකුත් පුරප්පාඩු හේතුවෙන් අමාත්‍යාංශ කටයුතු වලදීද අවහිරතා ඇති වීමට ද ඉඩකඩ තිබුණු බව නිරීක්ෂණය විය | ගුරු අධ්‍යාපනඥ සේවයේ හා අධ්‍යාපන පරිපාලන සේවයේ පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | සේවා අවශ්‍යතා සැලකිල්ලට ගෙන පුරප්පාඩු පුරවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකල යුතුවීම. |